ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

# **කොළඹ ධර්මායතන විහාරය සඳහා ධර්මචක්‍ර මුද්‍රාව සහිත බුද්ධ ප්‍රතිමාවක් තිළිණ කෙරේ**

ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා විසින් 2024 සැප්තැම්බර් 17 වන දින වන අද දින බිනර පොහොය සහ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 160වන ජන්ම සංවත්සරය නිමිත්තෙන් ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඉදිරියේදී කොළඹ, බෞද්ධාලෝක මාවතේ ධර්මායතන විහාරය සඳහා ධර්මචක්‍ර මුද්‍රාව සහිත බුද්ධ ප්‍රතිමාවක් පිරිනමන ලදී.

2. අඩි 4ක් උස, ආසන්න වශයෙන් කිලෝ ග්‍රෑම් 330ක් බරැති මෙම ප්‍රතිමාව ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ඉල්ලීමක් අනුව සංස්කෘතික සබඳතා සඳහා ඉන්දියානු කවුන්සිලය විසින් විශේෂයෙන් නිර්මාණය කරන ලදී. ධර්මායතන විහාරයේ විහාරාධිපති පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමියන් විසින් භාරගන්නා ලද මෙම ප්‍රතිමාව ධර්මචක්‍ර මුද්‍රාවෙන් යුක්තය. මෙම මුද්‍රාව බුදුන් වහන්සේගේ ජීවිතයේ වැදගත්ම සංසිද්ධියක් වන උන්වහන්සේ විසින් සාරානාත්හි මිගදායේ ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වීම නිරූපණය කරයි. එබැවින් එය ධර්මයේ සක පෙරළීම සංකේතවත් කරයි.

3. මෙම වැඩසටහනේදී ධර්මායතන විහාර පරිශ්‍රය තුළ පැළ සිටුවීමේ උත්සවයක් ද පැවැත්විණ. #Plant4Mother වැඩසටහන සඳහා එක්වෙමින් ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යතුමා සහ ඉන්දීය මහ කොමසාරිස්තුමා විහාර පරිශ්‍රය තුළ ඉද්ද පැළ රෝපණය කළහ. #Plant4Mother වැඩසටහන අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් 2024 ලෝක පරිසර දිනයේදී නව දිල්ලියේ බුද්ධ ජයන්ති උද්‍යානයේ බෝ පැළයක් සිටුවමින් සමාරම්භ කරන ලදී. මෙම

වැඩසටහන යටතේ ශ්‍රී ලංකා ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය විසින් 2024 අගෝස්තු මාසයේදී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ජාතික සඳුන් උද්‍යානයේදී මුරුත පැළ සිටුවමින් ශ්‍රී ලංකා - ඉන්දියා මිත්‍රත්ව පෙදෙස විවෘත කරන ලදී.

4. අද දින පැවති උත්සවය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර බෙදා හදා ගන්නා උරුමය ශක්තිමත් කරයි. මෙම ශිෂ්ටාචාරමය බැඳීම තවදුරටත් ශක්තිමත් කිරීම වෙනුවෙන් ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා ශ්‍රී ලංකාව සමඟ බෞද්ධ සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා 2020 සැප්තැම්බර් මාසයේදී ඇමරිකානු ඩොලර් මිලියන 15ක විශේෂ ප්‍රදානයක් ප්‍රකාශයට පත් කළේය. මෙම විශේෂ ප්‍රදානය යටතේ පළමු ව්‍යාපෘතිය වශයෙන් ශ්‍රී ලංකාව පුරා බෞද්ධ විහාරස්ථාන සහ පිරිවෙන් 9000ක් සූර්ය බලයෙන් බල ගැන්වේ. මෙයට අමතරව ඇමරිකානු ඩොලර් මිලියන 17ක ණය පහසුකමක් යටතේ දිවයින පුරා බෞද්ධ විහාරස්ථාන 4000කට අධික සංඛ්‍යාවක් සඳහා සූර්ය විදුලි බලය ලබා දෙනු ඇත. කපිලවස්තු සහ සාරානාත් ධාතූන් වහන්සේලා ද මෑත කාලයේදී ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය කර ඇත. ඉන්දීය රජය ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන වෙත සංචාරය කරන ශ්‍රී ලාංකික බැතිමතුන් සඳහා විශේෂ සංචාර සඳහා අනුග්‍රහය ද ලබා දෙයි. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය, සහකාර මහ කොමසාරිස් කාර්යාලය, කොන්සියුලර් ජෙනරාල් කාර්යාල සහ ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය දෙරට අතර බෞද්ධ සබඳතා තවදුරටත් ගැඹුරු කිරීම සඳහා අඛණ්ඩව විවිධ මුලපිරීම් ක්‍රියාවට නංවයි. සෑම පොහෝ දිනකදීම ශ්‍රී ලංකාවේ විවිධ බෞද්ධ විහාරස්ථානවල පැවැත්වෙන ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන පිළිබඳ ප්‍රදර්ශනය සහ ශ්‍රී ලංකාව පුරා පිරිවෙන් සඳහා විවිධ සම්පත් ද්‍රව්‍ය ලබා දීම වැනි විවිධ ක්‍රියාමාර්ග රැසක් මෙයට ඇතුළත් වේ.

****

*කොළඹ*

*2024 සැප්තැම්බර් 17*